# වැලිගෙපොල ප්‍රාදේශීය සභාව (ජල කර්මාන්ත අංශය)

(අ) ආකෘතිය (9 වන අතුරු ව්‍යවස්ථාව)

1. (i) අයදුම්කරුගේ සම්පූර්ණ නම ..........................................................................................................................
   (සිංහලෙන් පැහැදිලිව) ............................................................................. පූජ්‍ය/මයා/මිය/මෙනවිය.

   (ii) මුලකුරු සමඟ නම ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් Rev/Mr/Mrs/Mrss (අදාල වචන ඉතිරි කර අනවශ්‍ය වචන කපා හරින්න.)

   (iii) ජාතික හැඳුනුම්පත් අංකය

2. ජල සම්බන්ධය අවශ්‍ය ස්ථානයේ ලිපිනය (සිංහලෙන් පැහැදිලිව)
   (i) නිවාස අංකය
   අතුරු පාර
   ග්‍රාමය/ප්‍රධාන පාර
   නගරය
   දිස්ත්‍රික්කය
   ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය
   (ii) ග්‍රා.නි. කොට්ඨාශය

3. (i) ලිපි යැවිය යුතු ලිපිනය

   (ii) දුරකථන අංකය

4. අයදුම්කරු එම ස්ථානයේ අයිතිකරු/බදු කරු/කුලී කරු ද යන වග

5. වරිපනම් සහතිකය/ ග්‍රාම නිලධාරී පදිංචි සහතිකය/ ඉඩමේ ඔප්පුව ඉදිරිපත් කරමි.
   (අනවශ්‍ය වචන කපා හරින්න)

6. (i) පාරිභෝගික කටයුතු සඳහා නම් කරන ලද බැංකුව

   (ii)ගිණුම් අංකය

7. (i) මෙම ස්ථානයේ මීට පෙර ජල සම්බන්ධයක් ලබාගෙන තිබේද

   (ii)තිබේ නම් වර්ගය

   (ගෘහ/රාජ්‍ය/ව්‍යාපාරික/ආගමික)

8. ඔබ ජල සැපයුම ඉල්ලුම් කරන ස්ථානයේ යම් ප්‍රජාමූල සංවිධානයකින් කරන ලද ජල යෝජනා ක්‍රමයකින් ආවරණය වන්නේද (ඔව්/නැත)

9. ජල සම්බන්ධය අවශ්‍යය ස්ථානය පහසුවෙන් සොයා ගැනීම සඳහා අවශ්‍ය සම්පූර්ණ විස්තර සහිත ස්ථානයට ළඟාවීමට හැකි මාර්ගය කටු සටහනකින් දක්වන්න.

(Downloaded By www.weligepola.ps.gov.lk)

10. යාබද නිවසේ ජල සම්බන්ධතාවයක් තිබේ නම් පදිංචිකරුගේ නම ....................................................................................................

මෙම අයදුම් පතෙහි දක්වා ඇති ස්ථානයට ජල සම්බන්ධයක් ලබා ගැනීම සඳහා ඊට අදාලව කොන්දේසි හා උපදෙස් කියවා හොඳින් තේරුම්ගත් බවත්, අයදුම් පතෙහි සඳහන් කළ සියළුම තොරතුරු සත්‍යය බවත්, අසත්‍ය තොරතුරු සැපයීම හේතුවෙන් ජල සම්බන්ධතාවය විසන්ධි කරන්නට සිදුවුවහොත් ඒ සඳහා වැලිගෙපොල ප්‍රාදේශීය සභාවට බලය ඇති බවත් හොඳින් දැන අත්සන් කරමි.

..........................................................

අයදුම්කරුගේ අත්සන

**කාර්යාලීය ප්‍රයෝජනය සඳහා**

**1.** **අයදුම්පත නිකුත් කළ දිනය**

**2.** **ලියාපදිංචි අංකය**

1. **කාර්මික නිලධාරිගේ වාර්තාව** ..........................................................................................................................
..........................................................................................................................
..........................................................................................................................
..........................................................................................................................

**2.** **ලබා දුන් ජල සම්බන්ධනය පිළිබඳ විස්තරය**

**(1)** **ප්‍රභේද ගෘහ/රාජ්‍ය/වාණිජ/ පූජනීය**

3. **මනු වර්ගය**

4. **මනුවේ ප්‍රමාණය**

**5.** **ජල සැපයීම දුන් දිනට කියවීම**

6. **මනු අංකය**

7. **ජල සැපයීම ලබාදුන් දිනය**

..........................................................

**සභාපති නිර්දේශය**

**අනුමත කරමි/නොකරමි.**

**අනුමත නොකරන්නේ නම් හේතු** ..........................................................................................................................
..........................................................................................................................
..........................................................................................................................

**දිනය** ..............................................

**ලිපිකරු සටහන්**

**තැන්පත් කළ මුදල**

**ලදුපත් අංකය හා දිනය**

**ජල කර්මාන්ත අංශයට යොමුව**

**වැඩ නිම කළ බවට කාර්මික නිලධාරී වාර්තාව**

**දිනය**

..........................................................

**අත්සන කාර්මික නිලධාරී**

(Downloaded By www.weligepola.ps.gov.lk)

# වැලිගෙපොල ප්‍රාදේශීය සභාව

## "ඇ" ආකෘතිය (42 වන අතුරු ව්‍යවස්ථාව)

1. එක් පාර්ශවයක් ලෙස මෙහි මින්මතු අයිතිකරු වශයෙන් සඳහන් කරනු ලබන ................................................................ ........................................................ පිහිටි වරිපනම් අංක ..........................දරණ ස්ථානයේ අයිතිකරු/පදිංචිකරු වන ..........................................................................................................සහ අනික් පාර්ශවය ලෙස වැලිගෙපොල ප්‍රාදේශීය සභාව ද අතර ගෘහමය කාර්යයන් සඳහා/ගෘහමය නොවන කාර්යයන් සඳහා ජලය සැපයීම පිණිස එළඹෙන ලද ගිවිසුමයි.

2. ගෘහමය නොවන කාර්යයන් සඳහා ඉහත කී ස්ථානයට ජල සේවයක් ලබාදීම සඳහා ප්‍රතිෂ්ඨාව, එනම්.
   (අ). ..........................................................................................................................................
   (ආ). ..........................................................................................................................................
   (ඇ). ..........................................................................................................................................

   මෙහි මින්මතු දක්වා ඇති කොන්දේසි වලින් බැඳී සිටීමට අයිතිකරු/පදිංචිකරු මෙයින් ගිවිස ගනී.
   (අ). අඟල් ........................................... මාපකයක් ජලය සැපයිය යුතුයි.
   (ආ). අයිතිකරු විසින් මාපක ගාස්තුව සහ ඇප මුදල් වශයෙන් රු..........................................................................
   ........................................................................................................... ක (රු.................................)
   මුදලක් සේවා සැපයීමට කලින් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට ගෙවීම හෝ ගෙවීමට සැලැස්විය යුතුය.
   (ඇ). එක් එක් මාසයේදී සපයන ලද ජල ප්‍රමාණය වෙනුවෙන් සභාව විසින් නියම කර ඇති ගාස්තුව අනුව ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට ගෙවීම හෝ ගෙවීමට සැලැස්විය යුතුය.

3. මාපකය සඳහා හෝ ජලය සඳහා වූ ගාස්තු නියමිත දිනයෙන් දින 15 ක් ඇතුළත ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට ගෙවනු නොලැබුවහොත් සේවාව පාවිච්චි කිරීමේ අයිතිය අහිමි වන අතර ප්‍රාදේශීය සභාව විසින් නතර කල හැකිය.
4. දෙපාර්ශ්වයෙන් කවර පාර්ශ්වයක් වුවද ගිවිසුම අවසන් කිරීමට තමා අදහස් කරන බව දන්වන දින 30 ක දැන්වීමක් අනෙක් පාර්ශ්වයට දීමෙන් ගිවිසුම අවසන් කල හැකිය. එය එසේ අවසන් කරනු ලැබූ විට අළුත් ගිවිසුමකට එළඹෙන තුරු ස්ථානයේ අයිතිකරුට/පදිංචිකරුට සේවාව පාවිච්චියට ගැනීම සඳහා අයිතිවාසිකම් නොමැත්තේය.

පදිංචිකරු වෙනස්වීමට ආසන්න කවර අවස්ථාවකද වුවද අයිතිකරු විසින් නිසි ලෙස දැන්වීමක් කල යුතු අතර, ඉහත සඳහන් කොන්දේසි පිළිපැදීමට ලියවිල්ලක් මගින් එකඟ වන තෙක් කිසිම පදිංචිකරුවෙකුට සේවාව පාවිච්චි කිරීමට හිමිකම් නොලැබේ.

201.......... ක්වූ ...............................මස ..................... වන දිනදී අත්සන් කරන ලදි.

.............................................
ප්‍රාදේශීය සභාවේ සභාපති

...................................................
අයිතිකරු/පදිංචිකරු

අත්සනට සාක්ෂි :-

(Downloaded By www.weligepola.ps.gov.lk)

# පොදු කොන්දේසි හා උපදෙස්

ජලය සැපයුම පිළිබඳව පහත දක්වා ඇත්තේ පොදු කොන්දේසි මිස 1988 අගෝස්තු 23 වන දින අංක 520/7 දරණ ගැසට් පත්‍රයේ (ඇති ජලසම්පාදනය පිළිබඳ නියෝගය හෝ කොන්දේසි නොවන බව කරුණාවෙන් සලකන්න.)

01. සපයනු ලබන ජලය අපතේ නොයැවීමට හා අයතා පරිදි පාවිච්චි නොකිරීමට වග බලා ගත යුතුයි.

02. ගෘහ කාර්ය සඳහා සපයනු ලබන ජලයෙන් යම් කොටසක් රඳවා ගැනීම සඳහා ගැලුම් 100 ට වැඩි ධාරිතාවය ඇති ජල භාජනයක් මේ සඳහා භාවිතා නොකල යුතුය.

03. ප්‍රාදේශීය සභාව විසින් යම් ඉල්ලුම්කරුවෙකුට දෙනු ලබන සම්බන්ධයේ ප්‍රමාණය තරණය කළ යුතුය.

04. වැලිගෙපොල ප්‍රාදේශීය සභාවේ සභාපති විසින් ජල සැපයුම හා සම්බන්ධ කාර්යයන් සඳහා බලය පවරන ලද කවර නිළධාරියෙකුට වුවද සියළු අභ්‍යන්තර ජලනළ හා සමීක්ෂණය කරන ලද උපකරණ පරීක්ෂා කර බැලීමට සතියේ ඕනෑම දිනයක පෙරවරු 6.00 සිට පස්වරු 6.00 දක්වා ඉඩපහසුකම් ලබා දිය යුතුය.

05. ජලය මැනීම සඳහා වූ සියළුම මාපක ප්‍රාදේශීය සභාව විසින් සපයා සවි කළ යුතු අතර ඒවා ප්‍රාදේශීය සභාවේ දේපල ලෙස පැවතිය යුතුය.

06. ගොඩනැගිල්ලක් හෝ ගොඩනැගිලි ඉදි කිරීමේ කාර්යය යම් ස්ථානයකට ප්‍රාදේශීය සභාව විසින් තාවකාලිකව සම්බන්ධ කිරීමක් මගින් ජලය සපයනු ලබන අවස්ථාවක ඒ ගොඩනැගිල්ල ගොඩනැගිල්ල ඉදි කරනු ලැබූ විට ඒ සැපයීම නතර කරනු ලැබිය යුතුය.

07. යම් ස්ථානයකට සපයනු ලබන ජලය නතර කිරීම/අත්හිටුවීම/අඩු කිරීම හෝ ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන ජල නළ වලින් හෝ කර්මාන්තයෙන් එම ස්ථානයට ජලය සපයන නළ මාර්ගය වෙනස් කිරීම පහත සඳහන් අවස්තාවන්හිදී සිදු කළ හැකිය.

   (i) එම ස්ථානයේ අයිතිකරුගේ හෝ පදිංචි කරුගේ ඉල්ලීම පිට

   (ii) එම ස්ථානයේ අයිතිකරුගේ හෝ පදිංචිකරු ගෙවිය යුතු මුදල් හිඟ තබා ඇති විට

   (iii) එම ස්ථානයේ අයිතිකරුගේ හෝ පදිංචිකරු විසින් රම සේවය වැඩි කිරීම සඳහා නළයක් දැමීම හෝ වෙනස් කිරීම නීත්‍යානුකූලව සිදු කර නැති විට

   (iv) ජල කර්මාන්තයට අලාභහානි කිරීම/ජලය අපවිත්‍ර කිරීමට/නාස්ති කිරීමට හෝ අයුතු ලෙස පාවිච්චි කිරීමට ක්‍රියා කිරීම එම ස්ථානයේ අයිතිකරු හෝ පදිංචිකරු විසින් යම් ක්‍රියාවක් හෝ දෙයක් කර හෝ නොකර පැහැර හැර ඇති අවස්ථාවක.

08. ගෘහ කාර්යයන් හැර වෙනත් කාර්යයන් සඳහා ජලය ලබා ගන්නා තැනැත්තා ගිවිසුමකට ඇතුළත්ව ඇතොත් මිස ජලය ලබා නොගත යුතුය.

(Downloaded By www.weligepola.ps.gov.lk)

09. ජල ගාස්තු සභාව නියමිත බිල් පත් ඉදිරිපත් කිරීමෙන් පසු දින 14 ක් ඇතුළත සියළු මුදල් ගෙවීමට ස්ථානයේ අයිතිකරු/බදුකරු/කුළීකරු බැඳී සිටී.

10. ජල පාරිභෝගිකයා/නිවාස හිමියා හෝ වෙනත් අයෙකු වුවද/ජල සැපයුම නැවත ලබා ගන්නේ නම් එසේ කිරීමට කටයුතු කරනු ලබන්නේ ඒ සඳහා වැය වන සියළුම මුදල් හා හිඟ ගාස්තු සියල්ල ගෙවූ පසුව පමණි.

11. ජල සැපයීමට නොහැකි වූ අසාමාන්‍යය නියඟය හෝ යම් කර්මාන්තයක් කිරීම නිසා ජල සැපයුමට ඇති වන තාවකාලික බාධා හෝ යම් නොවැලැක්විය හැකි හේතුවක් හෝ යම් අනතුරකින් නිසා සිදුවූවක් නම් ජලය සැපයුම කරනු ලබන්නේ කොන්ත්‍රාත්තුවක් හෝ වෙනත් ආකාරයකින් වුවද එසේ ජලය සැපයීමට අපොහොසත් වීම සම්බන්ධයෙන් අලාභ ගෙවීමට ප්‍රාදේශීය සභාව බැඳී නැත.

12. අදාළ ජල සැපයුම ඇති ස්ථානය විකුණූ ලැබුවහොත් නව අයිතිකරු විසින් ඇප තැන්පතුවක් ගෙවීමෙන් අනතුරුව නව ගිවිසුමක් අත්සන් කළ යුතු අතර එසේ නොකළහොත් එම ජල සැපයුම විසන්ධි කිරමේ බලය සභාව සතුය.

13. අයදුම්කරු ජල සම්බන්ධතාවය අවශ්‍ය කරන ස්ථානයේ නීත්‍යානුකූලව අයිතිකරු නොවේ නම්, අදාළ කොට්ඨාශයේ ග්‍රාමසේවක හෝ සාමදාන විනිශ්චයකරුවකු විසින් සහතික කරන ලද අයිතිකරුගේ කැමැත්ත සහිත ලිපියක් අයදුම්පතට ඇමිණිය යුතුය.

14. ජල සම්බන්ධතාව ඉල්ලුම් කරන්නේ දැනට ප්‍රජාමූල සංවිධානයේ ජල යෝජනා ක්‍රමයකින් ජලය ලබා ගන්නා අයෙක් නම් ප්‍රජාමූල සවිධානයෙන් එකඟතාවය ලබා ගත් ලිපියකින් ඉදිරිපත් කළ යුතුය.

..............................................................................වන මම/අප ඉහත සඳහන් පොදු කොන්දේසි හා උපදෙස් සියල්ල මැනවින් කියවා බලා තේරුම් ගත් බවත් එම කරුණූ සියල්ලම හා වරින් වර පනවනු ලබන කවර හෝ කොන්දේසි වලට අනුකූලව ක්‍රියා කිරීමට එකඟ වන බවටත් මෙයින් සහතික වෙමි/වෙමු.

දිනය

.................................................

අත්සන

ඉල්ලුම්කරු/කුලීකරු/බදු කරු

(Downloaded By www.weligepola.ps.gov.lk)

...............................................................

...............................................................

...............................................................

...............................................................

ගරු සභාපතිතුමා,

වැලිගෙපොල ප්‍රාදේශීය සභාව,

හුණුවල,

ඕපනායක.

සභාපතිතුමනි,

<u>**නිවසට ජලය ලබා ගැනීමේදී ගෙවිය යුතු ජල සේවා ගාස්තු වාරික වශයෙන් ගෙවීම.**</u>

ඉහත සඳහන් මාගේ නිවසට ජලය ලබා ගැනීමේදී ජල සේවා ගාස්තු ලෙස ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු මුදල රු. .................................. කි. එම මුදලින් රු. ................................ ක් ............................... දින අංක ................................. යටතේ ගෙවා ඇති අතර, ඉතිරි මුදල සමාන වාරික .................... කින් ගෙවා නිම කිරීමට මෙයින් පොරොන්දු වෙමි. වාරික මුදල් ඒ මාසය සඳහා වන ජල බිල්පත ද සමඟ ජල සැපයුම ලබා දෙන ලද මාසයේ සිට මාස ....................................... ක් තුළ ගෙවා නිම කිරීම සඳහා එකඟ වෙමි.

02. ඉහත පරිදි ගෙවීම් කිරීමට මා අපොහොසත් වුවහොත් කිසිදු දැනුම් දීමකින් තොරව හා වන්දි ගෙවීමකින් තොරව මාගේ ජල සැපයුම විසන්ධි කිරීමේ බලය වැලිගෙපොල ප්‍රාදේශීය සභාව සතු බව මම පිළිගනිමි.

03. ඉහත පරිදි මුදල් ගෙවීම පැහැර හැරීම හේතුවෙන් ජල සැපයුම විසන්ධි කළහොත් ඒ දක්වා ගෙවා ඇති මුදල් වැලිගෙපොල ප්‍රාදේශීය සභාව සතු වන බවත්, නැවත ජල සැපයුමක් ලබා ගන්නේ නම් ඒ සඳහා වන සියළුම මුදල් ද එකවර ගෙවිය යුතු බවත්, මා දන්නා බවට මෙයින් සහතික වෙමි.

| | | |
|---|---|---|
| ............................... | ................................................ | ............................................... |
| දිනය | ජල පාරිභෝගික තැනගේ අත්සන | හැඳුනුම්පත් අංකය |

අනුමත කරමි.

..................................

සභාපති/ලේකම්,

වැලිගෙපොල ප්‍රාදේශීය සභාව.

(Downloaded By www.weligepola.ps.gov.lk)

.................................................................................................................... ජල සේවාව

## ලබා දීමේ වියදම් ඇස්තමේන්තුව

| | | | ඒකක මිල | මිල |
|---|---|---|---|---|
| 1. | ....................... 4 ................. | මීටර් ½" පී.වී.සී බට සවි කිරීම | 40.00 | 160.00 |
| 2. | .................. 1 ½ x ½ ......... | පී.වී.සී. සොකට් සවි කිරීම | 400.00 | 400.00 |
| 3. | ..................2 ....................... | ½" පී.වී.සී. බෙන්ඩ් සවි කිරීම | 25.00 | 50.00 |
| 4. | ..................2..................... | ½" පී.වී.සී. එල්බෝ සවි කිරීම | 25.00 | 50.00 |
| 5. | ..................1.................... | ½" ස්ටොප් වැල්ව් සවි කිරීම | 150.00 | 150.00 |
| 6. | ..................3.................... | ½" පී.වී.සී. වැල්ව් සොකට් සවි කිරීම | 25.00 | 75.00 |
| 7. | ..................1...................... | මනුවක් සවි කිරීම | 5000.00 | 5000.00 |
| 8. | ..................2...................... | ½" පොසස් සොකට් සවි කිරීම | 25.00 | 50.00 |
| 9. | කරුණ - වැඩ කුලී සහ පරීක්ෂණ ගාස්තු | | 2000.00 | 2000.00 |
| | | | | 7935.00 |
| | | 10% දෙපාර්මේන්තු ගාස්තු | | 793.50 |
| | | 10% ප්‍රවාහන ගාස්තු | | 793.50 |
| | | | | 9522.00 |
| | | ආරක්ෂක ඇප | | 1000.00 |
| | | | | 10522.00 |

සකස් කළා :

කාර්මික නිලධාරී

වැලිගෙපොල ප්‍රාදේශීය සභාව

අනුමත කරමි.

සභාපති

වැලිගෙපොල ප්‍රාදේශීය සභාව

(Downloaded By www.weligepola.ps.gov.lk)